# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2054/38 - 2018 ජනවාරි මස 17 වැනි බදාදා - 2018.01.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සමිති ආඥාපනත

සමිති ආඥාපනතේ (123 අධිකාරය) 3 වන හා 4 වන වගන්තිවලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් වන මම මේ නිවේදනයෙන්,

01. උඩුතුත්තිරිපිටිය, වරපලාන, අංක 110 දරන ස්ථානයේ පිහිටි ''ගම්පහ කාබනික ගොවීන්ගේ සංගමය'' නමැති සමිතිය ආරම්භ කරනු ලැබූ පරමාර්ථයන් ඒ ආඥාපනතෙහි බලතල හා පහසුකම් ව්‍යාප්ත කළ යුතු පරමාර්ථයන් වශයෙන් නියම කරමි ; සහ

02. ඒ ආඥාපනතෙහි 5(4) වගන්තියේ විධිවිධාන වලින් නිදහස් කිරීමෙන් ඒ ආඥාපනත අදාළ කිරීම එකී සමිතියට සීමා කරමි.

රිෂාඩ් බදියුදීන්,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය.

2017 ක් වූ දෙසැම්බර් මස 29 වැනි දින,
අංක 73/1, ගාලු පාර,
කොළඹ 03,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

02 - 129

1A - G 26961 — 12 (2018/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*